## රටට උචිත දේශපාලන දර්ශනයක් නෑ:

# ආසියාවේ සෙසු රටවල් දියුණු වෙද්දී ශ්‍රී ලංකාව තව තවත් දුප්පත් වුණා

## මහචාර්ය අමරසිරිද සොයිසා කියයි

(රන්ජිත් ආනන්ද ජයසිංහ)

නිදහසින් පසුව ගතවූ වසර 50කට වැඩි කාලය තුළ ශ්‍රී ලංකාවට උචිත දේශපාලන දර්ශනයක් මත රටේ පාලනය ගෙනයාමට ශ්‍රී ලාංකික පාලකපන්තියට නොහැකිවූ නිසා ආසියාවේ සෙසු රටවල් දියුණුවට පත්වෙද්දී ශ්‍රී ලංකාව තවතවත් දුප්පත් වූ බව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මහාචාර්ය අමරසිරිද සොයිසා මහතා ප්‍රකාශ කළේය.

මහාචාර්ය සොයිසා මහතා මෙම ප්‍රකාශය කළේ දකුණු කොළඹ ප්‍රදේශයේ දේශපාලන නායකයන් පුහුණු කරවීම සඳහා කොළඹ ජානකී හෝටලයේ පසුගියදා පැවැති වැඩමුළුවකදීය.

කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී මිලින් ද මොරගොඩ මහතා මෙම වැඩමුළුව සංවිධානය කළේය.

මෙම වැඩමුළුවේදී තවදුරටත් අදහස් දැක්වූ මහාචාර්ය අමරසිරි ද සොයිසා මහතා සඳහන් කළේ මෙරට පාලනය කළ දේශපාලන නායකයන් විටින් විට තම තමන්ගේ පෞද්ගලික වුවමනාවන් මත රටේ දේශපාලනය හැඩගැන්වූ නිසා රටට විශාල හානියක් සිදුවූ බවය.

බොහෝ දෙනා කල්පනා කළේ බලය ලබාගැනීම ගැන පමණි. මේ හටන නිසා ශ්‍රී ලංකාව ආර්ථික වශයෙන් පරිහානියට යද්දී ඉන්දියාව, මලයාසියාව, දකුණු කොරියාව වැනි රටවල් දියුණුවෙන් දියුණුවට පත් වූ බව මහාචාර්යවරයා වැඩිදුරටත් සඳහන් කළේය.

මේ නිසා ඉදිරි පරම්පරාව ගැන සිතන ඡන්දදායකයන් ශ්‍රී ලංකාවට අවශ්‍ය වී ඇති බවද තාවකාලික ජනප්‍රිය බව ගැන නොසිතා රටේ අනාගතය ගැන තීරණ ගන්නා දේශපාලනයක් මේ රටට දැන්වුවමනා බවද මහාචාර්යවරයා කීය.

මෙම වැඩමුළුව අමතා අර්වින් වීරක්කොඩි, මහාචාර්ය තිස්ස කාරියවසම් හා හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී හෙන්රි ජයමහ යන මහත්වරුද කතා කළෝය.



මහාචාර්ය අමරසිරි ද සොයිසා මහතා වැඩමුළුව ඇමතූ අයුරු. පාර්ලිමේන්තු මන්ත්‍රී මිලින්ද මොරගොඩ හා හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී හෙන්රි ජයමහ යන මහත්වරුද මෙහි වෙති.